ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
இலங்கை தூதராலயம்
Embassy of Sri Lanka

Via Adige 02, 00198 Rome, Italy.

මගේ යොමුව / எனது குறிப்பு / My Ref.

ඔබේ යොමුව / உமது குறிப்பு / Your Ref.

දිනය / திகதி / Date

## රියදුරු බලපත් පිළිබඳ ඉතාලි ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික ගිවිසුම

ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රයක් පරිවර්තනය මගින් ඉතාලි රියදුරු බලපත්‍රයක් ලබාගැනීම සඳහා දෙරට අතර අත්සන් තබන ලද ද්විපාර්ශවික ගිවිසුම කඩිනමින් ක්‍රියාවට නැංවීම සඳහා රෝමයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය අදාල ඉතාලි හා ශ්‍රී ලාංකීය ආයතන සමග දිනපතා සම්බන්ධීකරණයෙන් කටයුතු කරගෙන යමින් පවතී.

දෙරට අතර මෙම ගිවිසුම 2011 මැයි මස 20 දින අත්සන් තබන ලද අතර එය වසර දෙකක් තිස්සේ දෙරට අතර පැවති සාකච්ඡාවන්හි ප්‍රතිඵලයක් ලෙස තබන ලද විශේෂිත ඉදිරි පියවරකි.

එමෙන්ම එය දෙරට අතර පවත්නා උණුසුම් සුහද සම්බන්ධතාවයේ මහගු පිලිබිඹුවක් මෙන්ම ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකිකයින් විසින් ඉතාලියට ලබාදෙන මහත්වූ ආර්ථික හා සාමාජයීය දායකත්වය වෙනුවෙන් ඉතාලි රජය විසින් ඔවුන් වෙත පුදන ලද උපහාරයක්ද වේ.

මෙම ගිවිසුම අනුව අයදුම්පත් භාරගැනීම සඳහා අදාල නියෝජිතායතන සූදානම් බව දෙපාර්ශවය විසින් ලිඛිතව දැනුම් දීමෙන් පසු මෙම ගිවිසුම ක්‍රියාත්මක වනු ඇත .

මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්ශවය විසින්ම අදාල සියළුම පරිපාලන හා නීතිමය ක්‍රියාවලිය සම්පූර්ණකර අවසන් කල යුතුය.

ඒ අනුව අයදුම්පත් භාරගැනීම ආරම්භ කළහැකි අදාල දිනය ප්‍රකාශයට පත්කිරීමෙන් පසු පමනක් අදාල අංශ වෙත අයදුම්පත් යොමුකල යුතුය. මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්ශවයම අදාල සියළුම පරිපාලන හා නීතිමය ක්‍රියාවලිය සම්පූර්ණකර අවසන් කල යුතුය. මේ සඳහා දීර්ඝ නීතිමය හා පරිපාලන ක්‍රියාවලියක් සම්පූර්ණකල යුතුව ඇතත් අයදුම්පත් භාරගැනීමේ දිනය ඉතා ඉක්මනින් ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිතය.

පරිවර්තනය තුලින් ඉතාලි රියදුරු බලපත්‍රයක් ලබාගැනීම සඳහා

> ඉතාලියේ නේවාසික පදිංචිය ලබාගත් දිනයට පෙර ලබාගත් ස්ථිර ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රයක් තිබීම.
>
> අයදුම්පත් ඉදිරිපත් කරන දින වන විට ඉතාලියේ නේවාසික පදිංචිය ලබා වසර 4ක් ඉක්මවා නොතිබීම යන අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

කාර්යාලය / அலுவலகம் / Gen. Office 06 – 8554560 06 – 8840801
ෆැක්ස් / பெக்ஸ் / Fax 06 – 84241670
ඊමේල් / ஈ - மெயில் / E - mail embassy@srilankaembassyrome.org

ඉදිරියේදී අයදුම්පත් භාරගැනීමේ දිනය ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව ඊට අදාල අයදුම්පත් භාරගන්නා ඉතාලි ආයතනය (Motorizzazione) වෙත තම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

එම අයදුම්පත් සඳහා රියදුරුබලපත්‍රයක් නිකුත් කිරීමේ සම්පූර්ණ අයිතිය ඉතාලි රජය සතු වන අතර එම අයදුම්පත්වල යෝග්‍යතාවය තීරණය කරන අවසන් බලධාරියා වන්නේ ඉතාලි රජයයි.

දෙරට අතර ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියළු ක්‍රමවේදයන් සම්පූර්ණ කල වහාම ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් අදාල යෝග්‍යතා සහතික ලබාගැනීම පිලිබඳව හා අයදුම්පත් අදාල අංශ වෙත යොමු කිරීම පිලිබඳව ජනතාව වෙත නිවේදනය කෙරෙනු ඇත .

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය.

රෝමය

05.10.2011